# ලූහුනු දානය කල්ප ගණනක් දුගතියෙන් මිදීමට සහ නිවනට ද හේතු විය

## ලසුණදායක ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 156 -159)

හිමාලය ආසන්නයේ එක් තවුසෙක් ජීවත් වුණා. ඔහුගේ ආහාරය වුණේ ලූහුනු (ළූනු). විපස්සී බුදු රජාණන් වහන්සේ ගේ භික්ෂූන් වහන්සේලා වැඩ සිටින ආරාමයට ගිය ඔහු භික්ෂූන් වහන්සේලාට ලූහුනු පූජා කළා. සතුටු සිතින් දුන් ඒ දානය ඔහු කල්ප අනූ එකක් දුගතියෙන් මිදවූවා. ගෞතම බුදු රජාණන් වහන්සේගේ ශාසනයේ පැවිදි ව උතුම් රහත් බව ද ලැබුවා.